**ශීර්ෂය - 211 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**
**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| සිඒඑම්/ඩී/ජීපි/එම් එල්/2022,1.2.1 (ඈ)(i) | 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89 හි 06 ඡේදය ප්‍රකාරව අතිකාල දීමනා ලබා ගැනීමේදී චවුචර පිළියෙල කර සහතික කළ යුතුය. | 3.2(ඒ) |
| සිඒඑම්/ඩී/ජීපි/එම් එල්/2022,3.3(අ) | 1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 පරිදි 1998 ජනවාරි මස සිට වාණිජ මුද්‍රණ දීමනාව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ට ගෙවනු ලබන අතර එහිදී එක් මාසයක වාණිජ මුද්‍රණ ඇනවුමෙහි වටිනාකම ස්ථාවරව පවතින පාදක මුදල වන රු. මිලියන 40ට අනුපාත කර වාණිජ මුද්‍රණ දීමනාව ගෙවීම සිදු කරනු ලැබේ. වර්ෂ 23 කටත් වඩා පැරණි පාදක අගය වෙළඳපොළ තත්ත්වයන් සමඟ සංශෝධනය කළ යුතුය. | 3.2(අ) |
| සිඒඑම්/ඩී/ජීපි/එම් එල්/2022,3.3(ආ) | වානිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදී සපුරා ලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබූ කොන්දේසි වන පිරිවැය ගිණුම්කරන පද්ධතියක් හඳුන්වා දීම, මුද්‍රණ කටයුතු වල නිෂ්පාදන ඵලදායිත්වය වැඩිදියුණු කිරීම සහ | 3.2(ආ) |

| | | |
|---|---|---|
| | හදුනාගත් ප්‍රතිපාදනයන් සහිත ව්‍යාපෘතියක් ඇති කිරිම හෝ එයට විකල්පයක් ලෙස අත්තිකාරම් ගිණුමක් ඇති කිරිම යන කොන්දේසි තුන 1998 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වාම සපුරා ගෙන නොමැතිව බැවින් එම කොන්දේසි කඩිනමින් සැපිරිය යුතු බව. | |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) ආදායම් ලැබීම්**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව එකතු කළ අගය මත බදු ගෙවීම සඳහා මුදල් පදනම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. නමුත් ගනුදෙනුකරුවන්ට ඉන්වොයිසි ලබාදෙන අවස්ථාවේ බදු අනුපාත හා ඉන්වොයිස් වලට මුදල් ලැබෙන අවස්ථාවේ පවතින බදු අනුපාත වෙනස් වීම නිසා 2023 දෙසැම්බර් 31 දිනට අයකරගත නොහැකි එකතු වටිනාකම වූ රු.7,735,242 ක මුදල අයවියයුතු නමුත් අයකර ගැනීමට නොහැකි වූ ව්‍යාජ ආදායමක් ලෙස නිරූපණය වී තිබුණි. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව එකතුව කළ සාකච්ඡාවකින් පොදු එකඟතාවයකට පැමිණ මේ සඳහා දේශීය ආදායම් කොමසාරිස් වෙතින් සාකච්ඡාවක් ඉල්ලා ලිපි යොමු කර ඇත. එකතු කළ අගය මත බදු අනුපාත වෙනස් වීම සම්බන්ධව, දේශීය අදායම් දෙපාර්තමේන්තුවේ, කොමසාරිස් (බදු ප්‍රතිපත්ති හා නීති සම්පාදන) ගේ උපදෙස් අනුව ක්‍රියාත්මක වීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වා සිටිමි. | දේශිය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ එක්ව කඩිනමින් මෙම ගැටළුව විසදාගත යුතුය. |

**(ආ) පුනරාවර්තන වියදම්**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය තුළ 211-1-1-0-1301, 211-1-1-0-2003, 211-1-2-0-1301 හා 211-1-2-0-2003 යන වැය විෂයන්ට අනුමත ප්‍රතිපාදනයන් පුනරාවර්තන හෝ ප්‍රාග්ධන වියදම් වශයෙන් සලකනු ලබන්නේ කුමන වියදම්ද යන්න පැහැදිලි වර්ගීකරනයකින් තොරව වාහන සඳහා වන වියදම් 211-1-1-0-1301, 211-1-1-0-2003, 211-1-2-0-1301 හා 211-1-2-0-2003 යන වැය ලෙජරයන් තුළ සටහන් කර තිබුණි. | වර්ෂය අවසානය වන විට වියදම් නැවත සමාලෝචනය කිරීමේ දී මූලධන වැය ලෙජරයේ සටහන් කර තිබූ අඩු වටිනාකමක් සහිත වාහන අලුත්වැඩියා කිරීම් පුනරාවර්තන වියදම් ලෙසත්, පුනරාවර්තන ලෙජරයේ සටහන් කර තිබූ වැඩි වටිනාකමක් සහිත විශාල වාහන අලුත්වැඩියා කිරීම් මූලධන ලෙජරයටත් මාරු කිරීම් පත්‍ර යටතේ මාරු කර ඇත. | අදාල නෛතිය විධිවිධාන යටතේ වියදම දැරූ අවස්ථාවේදීම එය පුනරාවර්ථන වැයක්ද මූලධන වැයක්ද යන්න හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කිරිමට අවශ්‍ය පාලන පරිසරයක් ස්ථාපිත කළ යුතුය. |
| (ii) | දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට අනුමැතියක් නොමැති කැලිගණනට දිමනා ගෙවීම සඳහා, දෙපාර්තමේන්තුවේ 211-1-2-0-1205 විවිධ සැපයුම් වැය විෂයයෙන් රු.298,375,331 ක් නිසි අනුමැතියකින් තොරව ගෙවා තිබුණි. | 2023 පැවැත්විමට තිබූ පළාත් පාලන මැතිවරණයේ පෙර මුද්‍රණ කටයුතු සිදු කිරිමත් පසුව එය නොපැවැත්වීම නිසා මැතිවරණ කොමිසම් සභාව ලබා දී තිබූ ප්‍රතිපාදන පවරා ගැනිමත් නිසා 211-01-02-1003 වැය විෂයෙහි ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමට හේතුවක් විය. තවද ස්වදේශ කටයුතු අමාත්‍යංශයේ ඉ-ග්‍රාම ව්‍යාපෘතිය හා කෘෂිකර්ම අමාත්‍යංශයේ විශේෂ පොහොර වවුචරය ආදී විශේෂ මුද්‍රණ කටයුතු වෙනුවෙන් සේවකයින් යෙදවීම තුළ ඔවුන් වෙත ගෙවීමට සිදු වූ අතිරේක ශ්‍රම පිරිවැය හා සියයට 6 | වැය විෂයන්ගේ සිමාවන් තුළ තම වියදම් කළමණාකරණය කර ගතයුතුය. එම වැය විෂයයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන්නේනම් ඒ සඳහා ඇති නෛතික රාමුව තුළ සිට නිසි අනුමැතියක් යටතේ ප්‍රතිපාදන සලසා ගත යුතුය. මෙම මුදල සඳහා අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| | | පුනරාවර්තන වියදම් කපා හැරීම හේතුවෙන් එම වැය විෂයට අනුමත වූ ප්‍රතිපාදනය ප්‍රමාණවත් නොවිය. |

**(ඇ) තැන්පතු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වාණිජ මුද්‍රණ තැන්පතු ශේෂය රු.82,161,668 ක් වූ අතර 2024 මාර්තු 31 දින වන විටත් 2022 වර්ෂයට අදාල රු. 9,595,684 ක් වටිනා වාණිජ මුද්‍රණ කාර්යයන් සම්පූර්ණ කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ වාණිජ තැන්පත් ගිණුම, වාණිජ මුද්‍රණ කටයුතු වෙනුවෙන් පවත්වා ගෙන යනු ලබන්නක් වන අතර මුද්‍රණ කාර්යයන් ඉටු කිරීමට පෙර අදාළ ආයතනය විසින් ප්‍රතිපාදන වශයෙන් මුද්‍රණ වියදම් සඳහා වෙන් කර දෙනු ලබන ප්‍රතිපාදන එහි ඇතුළත් කර ඇත. මෙහිදී අදාළ කාර්යය නිම වූ විට එය වාණිජ තැන්පත් ගිණුමෙන් අඩු වන අතර එම කාලයේදී නව මුද්‍රණ කාර්යයන් සඳහා ප්‍රතිපාදන නැවත ලැබෙන බැවින් මෙම ගිණුම ශුන්‍ය කිරීමට නොහැකි ශේෂයක් බව දන්වා සිටිමි. | ඇණවුම් ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ කිරීමට හැකි අයුරින් අභ්‍යන්තර පාලන ක්‍රම සැලසුම්කර ක්‍රියාත්මක කර විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2010 සිට 2019 වර්ෂය දක්වා කාලය සඳහා අයවිය යුතු 2023 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් ශේෂය රු.162,170,469 ක් විය. එම ශේෂයෙන් රුපියල් මිලියනයකට වැඩි, රාජ්‍ය හා පුද්ගලික ආයතන 21 | 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාල සීමාවට අදාලව අයවිය යුතු හිඟ ආදායම් ශේෂය 2024 මාර්තු 31 දින වන විට රු. 161,578,044 ක් වේ. තවද 2024 මාර්තු 31 දිනට පෙර අදාළ ආයතන වෙත දන්වා | හිඟ ශේෂ අයකර ගැනිම සඳහා කඩිනම් වැඩ පිළිවෙලක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කින් අයවිය යුතු රු.81,348,365 ක ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | යවා ඇති අතර අයකර ගැනීම් සම්බන්ධයෙන් තවදුරටත් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ආ) | 2009 වර්ෂය හා ඊට පෙර වර්ෂ සඳහා මුද්‍රණ කටයුතු ඉටු කිරීම වෙනුවෙන් ආයතන 10 කින් අයවිය යුතු රු.81,019,843 ක හිඟ ආදායම් ශේෂය සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගෙන නොතිබුණි. | 2009 වර්ෂයට පෙර රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ඉටු කරවාගත් සේවාවන් වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. ආයතනයෙන් අයකර ගැනීමට ඇති රු. 10,155,733 ක මුදලට අදාළව ඉටුකර දී ඇති කාර්යයන් පිළිබඳව තොරතුරු ලබා ගැනීමට මේ වන විටත් කටයුතු කරමින් පවතින බව දන්වා සිටිමි. | පැරණි හිඟ ශේෂ අයකර ගැනීමට කඩිනම් වැඩ පිළිවෙලක් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් 2023 ජනවාරි 27 දින නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ අංක 01/2023 හි (02)(ඇ)iii පරිදි අතිකාල හා නිවාඩු දින වැටුප් සහ වෙනත් දීමනා සඳහා ප්‍රතිපාදන ද අවම වශයෙන් සියයට 6 කින් අඩු කල යුතු බවට අවධාරනය කර තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව විසින් අයවැය මගින් ලබා දී ඇති ප්‍රතිපාදන වලට අමතරව මු.රෙ 66 යටතේ අනුමැතිය ලබා ගත් රු.95,000,000 ක් ද, නිසි අනුමැතියන් නොමැතිව රු.298,375,331 ක මුදලක් හා 2023 දෙසැම්බර් 31 දිනට බැරකම් ලේඛනයේ | මෙම දෙපාර්තමේන්තුවේ කටයුතුවල ස්වභාවය අනුව එක් එක් කාර්යයන්හී නියැලෙන නිලධරයන් රාජකාරී වේලාවෙන් පසුව හා සති අන්ත කාලයේදී ද රජයේ අත්‍යවශ්‍ය හා හදිසි රාජකාරී වෙනුවෙන් යෙදවීම මත එම නිලධරයන්ට අතිකාල දීමනා ගෙවීමට සිදු වේ. එබැවින් 211-01-02-1002 වැය විෂය සඳහා රු.මි. 40 ක ප්‍රතිපාදනයක් මු.රෙ 66 යටතේ අනුමැතිය සහිතව මාරු කර ගෙවීම් සිදු කළ අතර මැතිවරණ මුද්‍රණ කටයුතු වලින් සියයට 90 ක ප්‍රමාණයක් නිම කර තිබු අවස්ථාවේ දී අප වෙත මැතිවරණ කොමිසන් සභාව විසින් ලබා දී තිබූ රු.මි. 300 ක ප්‍රතිපාදනය නැවත පවරා ගන්නා ලදුව 211-01-02-1003 වැය විෂය සඳහා මු.රෙ. 66 යටතේ එම රු.මි. 300 ප්‍රතිපාදන මාරු කර | අදාළ චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතු අතර ඉදිරියේදි මෙවැනි තත්ත්වයන් ඇති නොවීමට අවශ්‍ය පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කල යුතුය. |

| | | |
|---|---|---|
| ඇතුළත් නොකර දෙසැම්බර් මාසයට අදාළ ව 2024 ජනවාරි සහ පෙබරවාරි මාස දෙක තුළ ගෙවූ දීමනා වූ රු.92,353,696 සමග එකතුව රු.1,509,819,572 ක මුදලක් අතිකාල හා වෙනත් දීමනා ලෙස වියදම් කර තිබුණි. නමුත් 2023 වර්ෂයේ අතිකාල හා වෙනත් දීමනා ලෙස අයවැයෙන් රු.992,000,000ක ප්‍රතිපාදනයක් අනුමත කර තිබුණි. එම නිසා දෙපාර්තමේන්තුව අයවැය චක්‍රලේඛ අංක 01/2023 විධිවිධාන උල්ලංඝනය කරමින් සමස්ථ අතිකාල දීමනා සහ වෙනත් දීමනා ගෙවීම්, අනුමත ප්‍රතිපාදන ඉක්මවා සියයට 52.2 ක් වැඩියෙන් වියදම් කර තිබුණි. | ගැනීම සම්බන්ධ කටයුතු ද මේ වන විට අවසන් අදියරෙහි පවතින බව දන්වා සිටින අතර මෙවැනි අවස්ථාවල දී ආයතන පවත්වා ගෙන යාම සඳහා කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ද සාකච්ඡා කරමින් පවතී.<br><br>එසේම, මෙම දෙපාර්තමේන්තුවේ සේවක මණ්ඩලය විසින් රජයේ අත්‍යවශ්‍ය මුද්‍රණ කටයුතු ප්‍රමාදයකින් තොරව සිදු කිරීම සඳහා කෑලි ගණනට සිදු කරනු ලබන දීමනා නිසි පරිදි ගෙවීම් සිදු නොකළ හොත් සිදු වන සේවක නොසන්සුන්තාවය පාලනය කිරීම සඳහා 211-01-02-1205 වැය විෂය යටතේ රුපියල් 338,369,363.00 ක දීමනා ගෙවීම සිදු කරන ලද්දේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහ රේඛීය අමාත්‍යාංශ ලේකම්ගේ දැනුවත් කිරීම සහිතව බව වැඩි දුරටත් දන්වා සිටිමි. | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩල පුහුණු සඳහා අනුමත 211-1-1-0-2401 හා 211-1-1-0-2401 යන වැය විෂයන් තුළින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 27 හා 28 දිනයන් හි රු.2,504,000 ක මුදලක් සේවක පුහුණු පාඨමාලා සඳහා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට ගෙවා | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවකයින්ගේ උසස් වීම් ව්‍යවස්ථාවට අනුව, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අනුබද්ධ ආයතනයක් වූ මෙම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා සම්පූර්ණ කළ යුතුය. පාඨමාලා ගාස්තු ගෙවීමේ පදනම මත පවත්වනු ලැබූ | නිශ්චිත කාර්යයන් සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන එම කාර්යයන් සඳහා උපයෝජනය කළ යුතුය. තවද ඉදිරියේදී මෙවැනි තත්වයන් ඇති නොවීමට අවශ්‍ය පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කල යුතුය. |

| | |
|---|---|
| තිබුණි. නමුත් මෙම ගෙවීම සඳහා 2023 මූල්‍ය වර්ෂය තුළදී මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කිසිදු සේවකයින්ට පුහුණු පාඨමාලා පවත්වා නොතිබුණු බවත් හුදෙක්ම වර්ෂය අවසාන වන විට ප්‍රතිපාදනය අවසන් කිරීමේ අරමුණින් මෙම ගෙවීම සිදුකර ඇති බවත් නිරීක්ෂණය විය. | පාඨමාලා 10ක් සඳහා 2023 වර්ෂය තුල දී ද නිලධාරීන් 116 දෙනෙකු සහභාගී කරවා ඇත. |

3.2 වෙනත් නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 පරිදි 1998 ජනවාරි මස සිට වාණිජ මුද්‍රණ දීමනාව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්ට ගෙවනු ලබන අතර එහිදී එක් මාසයක වාණිජ මුද්‍රණ ඇනවුමෙහි වටිනාකම ස්ථාවරව පවතින පාදක මුදල වන රු. මිලියන 40ට අනුපාත කර වාණිජ මුද්‍රණ දීමනාව ගෙවීම සිදු කරනු ලැබේ. 1998 වර්ෂයේ සිට මෙය ක්‍රියාත්මක වන අතර එම වර්ෂයේ සිට වර්තමානය තෙක් රටේ පැවති උද්ධමනය, රාජ්‍ය සේවයේ වැටුප් වැඩිවීම යන සාධක සැලකිල්ලට ගෙන එම රු. මිලියන 40 සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | අංක 97/5232/17/035 දරන 1998 මාර්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයෙන් ලද අනුමැතිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වාණිජ නිෂ්පාදන සඳහා එම නිෂ්පාදනවල වටිනාකමින් මිලියන 40 ක වටිනාකමට ඒ ඒ නිලධාරියාගේ මූලික වැටුපෙන් සියයට 100 ක් වන පරිදි අනුපාතිකව දිරි දීමනාවක් ගෙවීමට අනුමැතිය හිමිව තිබුණි. ඒ සඳහා එම එම නිලධාරියා අවම දින 18 ක් හා අමතර පැය 22 ක් සේවය කළ යුතුව තිබුණි.<br><br>පසු කාලීනව උක්ත දිරි දීමනාව, එම මාසය තුළ වාණිජ නිෂ්පාදනවල වටිනාකමින් මිලියන 40 ක වටිනාකමට ඒ ඒ නිලධාරියාගේ මූලික වැටුපෙන් සියයට 65 ක් දක්වා අඩු කළ අතර අවම | වාණිජ මුද්‍රණ දීමනා ගෙවීමේදී භාවිතා කරන මෙම වසර 25 ක් පැරණි පාදක අගය (මිලියන 40) නිමවුම, මිල ගණන් ඉහළ යාම, රාජ්‍ය සේවක වැටුප් වැඩි වීම යන සාධක සැලකිල්ලට ගෙන කඩිනමින් සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | දින 18 ක් සේවයට පැමිණීමට අත්‍යාවශ්‍ය වන අතර අමතර පැය ගණන පැය 30 දක්වා සේවය කළ යුතු බවට ඉහළ නංවා ඇත. මෙම දීමනාව ලබා ගැනීම සඳහා වසරේ දින 365 න් දවසේ පැය 24 න් ඕනෑම වේලාවක සේවය සඳහා පැමිණීමට බැඳී සිටී. ඉහත දීමනාව සඳහා වාණිජ පදනම මත නොවන සියලුම නිෂ්පාදන දෛනික නිෂ්පාදනයක් ලෙස ඉවත්කර වාණිජ පදනම මත සිදු කෙරෙන නිෂ්පාදනයන්වල වටිනාකම පමණක් සැලකිල්ලට ගනු ලැබේ.මේ සඳහා සපුරාලන කොන්දේසි වන අවම දින 18 හා අතිරේක පැය 30 ට නිවාඩු දින දීමනා හෝ වෙනත් කිසිම දීමනාවක් ලබා ගැනීමට හිමිකමක් නොමැත.<br><br>තව ද මෙම දීමනාව උපයාගත හැකි වන්නේ වාණිජ මුද්‍රණ නිෂ්පාදයන්හී වටිනාකම මත වන අතර එක් එක් මාසය තුළ උපයන මුදල ද ඒකාකාරී නොවේ. වාණිජ මුද්‍රණ නිෂ්පාදනය සිදු නොවන අවස්ථාවල මෙම දීමනාව හිමි නොවේ. මෙම දීමනාව ද කාලීන වශයෙන් ගැලපෙන පරිදි සංශෝධනය කිරීම ඇතුළු අවශ්‍ය කටයුතු මේ වන විට නිම කර ඇත. | |
| (ආ) | වානිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදී සපුරා ලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබූ කොන්දේසි වන පිරිවැය ගිණුම්කරණ පද්ධතියක් හදුන්වා දීම, මුද්‍රණ කටයුතු | පිළිතුරු ලබා දී නොමැත. | කඩිනමින් අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා ඇති කොන්දේසි ඉටු කිරීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වල නිෂ්පාදන ඵලදායිත්වය වැඩිදියුණු කිරීම සහ හඳුනාගත් ප්‍රතිපාදනයන් සහිත ව්‍යාපෘතියක් ඇති කිරීම හෝ එයට විකල්පයක් ලෙස අත්තිකාරම් ගිණුමක් ඇති කිරීම යන කොන්දේසි තුන 1998 වර්ෂයේ සිට සපුරා ගෙන නොමැතිව සමාලෝචිත වර්ෂයේ දී රු.17,429,244 ක් වාණිජ මුද්‍රණ දීමනා ලෙස ගෙවා තිබුණි. | | |
| (ඇ) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය අනුව නිෂ්පාදන තත්ත්වය නඟා සිටුවීම සඳහා ගෙවනු ලබන දීමනා දැනට සේවකයෙකු ලබන වැටුපෙන් සියයට 65ක් වන සේ 2018 වර්ෂය දක්වා අනුමත කර තිබුණි. එසේ වුවද රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවකයන් සඳහා ඔවුන්ගේ මාසික වැටුපෙන් සියයට 65 ඉක්මවා සියයට 102 සිට සියයට 353 ක් දක්වා විවිධ වර්ගයේ දීමනා මාසිකව ගෙවා තිබූ බවට දෙපාර්තමේන්තුවේ අංශ දෙකක් තුළ සිදුකළ පරීක්ෂාවකදී අනාවරණය විය. | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වසරේ දින 365 න් ඕනෑම දිනක, දවසේ පැය 24 න් ඕනෑම වේලාවක රාජකාරියේ යෙදිය යුතු බැවින් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දීමනා ගෙවීම වසර ගණනක සිට සිදුකර ඇත. කාර්යය මණ්ඩලය වෙත ගෙවනු ලබන මෙම දීමනා සම්බන්ධ වාර්තාවන් වරින් වර වැටුප් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති නමුත්, එය සරල ක්‍රමවේදයක් ඔස්සේ සකස් කරන ලෙස උපදෙස් ලබා දී ඇත. මෙම දීමනා තවදුරටත් සරල ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීමේ දී දැනට ලබන ප්‍රතිලාභ සම්බන්ධයෙන් වෘත්තීය පාර්ශව සමඟ ගැටළුකාරී තත්ත්වයන් ඇති නොවන පරිදි සාකච්ඡා කර යම් එකඟතාවයන්ට එළඹ ආයතනය හා නිලධරයන් යන පාර්ශවයන් දෙකෙහිම අරමුණු ඉටුවන පරිදි මධ්‍යස්ථ එකඟතාවයන්ට එළඹීමට සිදු විය. ඒ අනුව, කෙටුම්පත් කර | අනුමත දීමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තිබූ මූලික වාර්තාවේ කරුණු සම්බන්ධයෙන් තවදුරටත් අධ්‍යයනයන් හා සාකච්ඡාවන් සිදුකර දීමනා ගෙවීම සම්බන්ධ අවසන් වාර්තාව සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර අවසන් අදියරේ පවතින බව දන්වා සිටිමි. | |
| (ඇ) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂක විසින් දෙපාර්තමේන්තුවේ කැලිගණනට දීමනා අනුමත කර ඇත්තේ 2018 වර්ෂය සඳහා පමණක් වන අතර ඊට පසුව ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතියක් ලබානොගෙන දෙපාර්තමේන්තුව කැලිගණනට දීමනා ලබාගෙන ඇති බවත් සමාලෝචිත වර්ෂයේදී කිසිදු අනුමැතියකින් තොරව රු.814,476,871 ක මුදලක් කැලිගණනට දීමනා ලෙස ලබා ගෙන තිබුණි. | මෙම දීමනා ගෙවීම සඳහා 1981 සිට 1998 වර්ෂය දක්වා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර අනුමැතිය මත ගෙවූ අතර නැවත 2006/6 චක්‍රලේඛයෙන් පසු නැවත වැටුප් සංශෝධන අනුව වරින් වර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන ඇති අතර 2008 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා එසේ අනුමැතිය ලැබී ඇත. 2019 වර්ෂයට අදාළව දීමනා ගෙවීම සඳහා ද අනුමැතිය ලබා ගැනීමට එවකට රේඛීය අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මෙම කාල සීමාව තුල දෙපාර්තමේන්තුව අමාත්‍යාංශ 05කට වැඩි සංඛ්‍යාවකට යොමු වීම ද මෙම කාර්යය ප්‍රමාද වීමට හේතුවක් විය. ඉන්පසු මෙම දීමනා සම්බන්ධයෙන් විෂයය භාර අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය, ජාතික වැටුප් කොමිෂන් සභාව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ආදී ආයතන සමඟ සමාලෝචන වාර්තාව සකස් කරන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් සහ සාමාජිකත්වයෙන් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය නියෝජනය කරමින් | 2018 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ආයතන අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතියකින් තොරව දීමනා ලබාගෙන ඇත. අදාල දීමනා සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය. තවද ඉදිරියේදී ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියෙන් තොරව දීමනා නොගෙවීමට වග බලාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ආයතන අධ්‍යක්ෂ ජනරාල් ද රේඛීය අමාත්‍යාංශය නියෝජනය කරමින් නිලධාරියෙකු ද ඇතුළත්වූ කමිටුව මඟින් එම වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර එම කටයුතු අවසන් අදියරේ පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඉ) | දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ලබා දෙන මුද්‍රණාලයාධිපතිගේ හැර වෙනත් කිසිදු අනුමැතියක් නොමැති කැලිගණනට දිමනා ගණනය කිරිම තුල සෘජුව නිෂ්පාදන කාර්යයන් වල නිරත වන නිලධාරින්ට සාපේක්ෂව වැඩ මුලික ඇතුළු අනිකුත් නිලධාරින්ට ලැබෙන දිමනා තුල විෂමතාවයක් පවතින බවට නිරික්ෂණය විය. | පිලිතුරු ලබා දී නොමැත | සාධාරණ අනුමත දීමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |
| (ඊ) | දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගෙන් වැඩ මුලික හා මුද්‍රණ කාර්ය සහයක නිලධාරින්ගේ කැලිගණනට දීමනා ගණනය කිරිම නිෂ්පාදනයට සෘජුව දායක වන නිලධාරින්ගේ සමස්ථ කැලිගණනට දිමනා මත පදනම් වන අතර මෙම වැඩ මුලික හා මුද්‍රණ කාර්ය සහයක නිලධාරින්ගේ නිෂ්පාදන සම්මතයන් කවරේද යන්න නිශ්චිතව හදුනා ගෙන නොතිබුණි. මේ ආකාරයට නිෂ්පාදන සම්මතයන් | දැනට දෙපාර්තමේන්තුවේ රාජකාරී ඉටු කරනු ලබන සියළුම සේවකයන් සඳහා ගෙවනු ලබන කැලි ගණනට දීමනා හා දීමනා ගෙවීම සම්බන්ධව අනුමැතිය ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කොට ඇත.<br><br>පොත් බැදීම් අංශයේ වැඩ මූලික හා මුද්‍රණ කාර්ය සහයක නිලධාරීන්ගේ කැලි ගණනට දීමනා ගෙවනු ලබන්නේ අංශයේ අනෙකුත් සේවකයන්ගේ කැලි ගණනට දීමනාවෙන් ප්‍රතිශත වේ. | විද්‍යාත්මක වැඩ සම්මතයන් සහිත සාධාරණ අනුමත දීමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හඳුනා නොගෙන බයින්ඩින් A අංශයේ වැඩ මූලික හා මුද්‍රණ කාර්ය සහායක නිලධාරින් 9 දෙනෙකුට සමාලෝචිත වර්ෂයේ පළමු මාස 07 තුළ රු.5,345,002 ක මුදලක් ගෙවා තිබුණි. | මන්ද යත්, යම් අංශයක නියාමකවරයා යනු එම අංශයේ පරිපාලනයට දායක වන නිලධාරියෙකු වන අතර ඔහු/ඇය විසින් අංශයේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලැබේ. එබැවින් ඔහු/ඇයට නිශ්චිත නිෂ්පාදන සම්මතයක් හඳුනා ගත නොහැකි අතර ඔහු/ඇය විසින් අංශයේ සියළුම නිෂ්පාදන ක්‍රියාවලිය අධීක්ෂණය කළ යුතු වේ. එබැවින් ඔහු/ඇයට නිෂ්පාදන සම්මතයක් අඳුනාගත නොහැකි බැවින් ඉහත ලෙස නිෂ්පාදනයට සෘජුවම දායක වන නිලධාරීන්ගේ සම්මත කැලි ගණනට දීමනාවෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවනු ලැබේ.<br><br>මුද්‍රණ කාර්ය සහයක නිලධාරීන් ද මෙලෙස අංශයේ නිෂ්පාදන ක්‍රියාවලියට සහය දක්වන කාණ්ඩයක් වන අතර ඔවුන්ගේ ද නිෂ්පාදන සම්මතයක් හඳුනාගත නොහැකිය. එබැවින් ඔවුන්ට ද නියාමකවරුන්ට ගෙවනු ලබන ආකාරයෙන් දීමනාවක් ගෙවනු ලැබේ. | |
| (උ) | කැලිගණනට දිමනා ගණනය කිරිම සඳහා දෙපාර්තමේන්තුවේ අංශ තුළ එකිනෙකට වෙනස් මාර්ගෝපදේශ භාවිතා කරන අතර ඒවා කිසිදු අනුමැතියකින් තොරව මුද්‍රණාලයාධිපතිගේ අභිමතය පරිදි සකස් කර ඇති බවට දක්නට ලැබුණි. | මෙලෙස ගෙවනු ලබන ප්‍රතිශතයන්ගේ විෂමතාවයක් පවතිනු ලබන බවට නිරීක්ෂණය කරනු ලබන බැවින් ඒ පිළිබඳව සමාලෝචනයක් සිදු කර එය නිම කර ඇත. | පොදු අනුමත දිමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඟ) | කැලිගණනට දීමනා ගණනය කිරිම සඳහා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අංශ තුළ එකිනෙකට වෙනස් මාර්ගෝපදේශ භාවිතා කරන අතර එම මාර්ගෝපදේශ තුළ ඇති කොන්දේසි අනුගමනය නොකර දිමනා ගණනය කර ඇති බවට දක්නට ලැබුණි. සමාලෝචිත වර්ෂයේ පලමු මාස 07 තුළ බයින්ඩින් A අංශයේ දිමනා ගණනය කිරිමේදි කොන්දේසියක් ලෙස “කැලි ගණනට දීමනාව ලබාගැනිම සඳහා සෑම සේවකයෙකුම අදාල මාසයේ දින 18 ක් හා එම දිනයන්හි අමතර පැයක් සේවයේ යෙදී සිටිය යුතුය” සඳහන් කර තිබුණද එම කොන්දේසිය නොසලකා 2023 වර්ෂයේ පලමු මාස 07 තුළදි රු.10,193,463 ක කැලි ගණනට දිමනා ගෙවා තිබුණි. | කැලි ගණනට දීමනා ගණනය කිරීම සඳහා මාර්ගෝපදේශයක් සකස් කොට ඇති අතර එය පිළිබඳව සියළුම නියාමකවරුන් දැනුවත් කොට ඇත. තවද අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නියාමකවරු හා අංශයේ සේවකයන් දැනුවත් කිරීමට කටයුතු කර ඇත. | පොදු අනුමත දීමනා ක්‍රමවේදයක් කඩිනමින් ස්ථාපිත කල යුතුය. තවද අදාළ කොන්දේසි කඩකරමින් ලබා ගෙන ඇති දීමනා නැවත අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ච) | දෙපාර්තමේන්තුවේ බයින්ඩින් A අංශයේ උප වැඩමුලික තනතුර දරන නිලධාරියා 2023 මැයි 18 දින සිට 2023 ජුලි 04 වන දිනය දක්වා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිට ඇති අතර ඒ කාලය තුළ 2023 ජුනි මාසය සඳහා කැලි ගණනට දිමනා ලෙස රු.147,735 ගෙවා තිබුණි. මෙම දීමනාව එම නිලධාරියාට හිමි 2023 වර්ෂයේ අප්‍රේල් දක්වා එකතු වී ඇති හිඟමුදලක් | පොත් බැදීම් A අංශයේ උප වැඩ මූලික තනතුර දරන නිලධාරියා 2023 මැයි මස 18 වන දින සිට 2023 ජුලි මස 04 වන දින දක්වා වැටුප් සහිත නිවාඩු යටතේ විදේශගත වී ඇත. උප වැඩ මූලික සඳහා 2023 මැයි මාසය සඳහා එනම් මැයි මස 01 දින සිට මැයි මස 17 වන දින දක්වා ගෙවා ඇති රු. 170,152 ක මුදල ගෙවා ඇත්තේ අදාළ කැලි ගණනට ගෙවීම්වල මුදලින් සියයට 9ක කොටසින් සියයට 75 ක | පුද්ගලානුබද්ධ දීමනා නොගෙවිය යුතු අතර නියමිත කාලයට අදාල වන දිමනා නිවැරදිව ගණනය කර නියමිත කාලය තුල ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලෙස දක්වා තිබුණි. නමුත් දෙපාර්තමේන්තුවේ අනිකුත් නිලධාරීන්ටද මේ ආකාරයට හිඟමුදල් ගෙවීමට තිබියදී මෙම නිලධාරියාට පමණක් ප්‍රථමයෙන් හිඟමුදල් ගෙවා ඇත්තේ කුමන පදනමකින්ද යන්නත් ඒ සඳහා අනුමැතිය ලබා ගෙන ඇත්තේ කාගෙන්ද හා එයට අදාල ගණනය කිරීම් කේසේද යන්නත් විගණනයට කරුණු අනාවරණය නොකෙරුණි. | අගයකි. 2023 ජුනි මාසය සඳහා කැලි ගණනට ගෙවීම් සිදු කර නොමැති අතර මෙහි සඳහන් රු 147,735 ක මුදල ගෙවා ඇත්තේ පෙර මාසයන්හී අප්‍රේල් මාසය දක්වා එකතු වී තිබූ හිඟ මුදල් වේ. එය වරින් වර ගෙවීම් පිළිබඳ සීමා පැනවූ අවස්ථාවල නොගෙවා ඉතිරිව තිබූ මුදලක් වන අතර මෙය මෙම නිලධාරියාට පමණක් ගෙවීමට සිදු වූ කරුණක් නොවන බව දන්වා සිටිමි. | |
| (ඒ) | 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89 හි 06 ඡේදය ප්‍රකාරව අතිකාල දීමනා ලබා ගැනීමේදී වවුවරයක් පිළියෙල කර සහතික කළ යුතු වුවද, ඒ ඒ කාර්යය මණ්ඩල සමාජිකයා අතිකාල වවුවරයක් පිළියෙල නොකරන අතර, කාල ගණන අංශය විසින් ලබා දෙන අතිකාල පැය ගණන අනුව අතිකාල දීමනා ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අදාල චක්‍රෙල්ඛය ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ඔ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ජේදයේ 2.1 හි සඳහන් “අතිකාල දීමනා ලබාගැනීමට ප්‍රමාණවත් පරිදි අතිකාල වැඩ නියම වශයෙන් හා සාධාරණ වශයෙන් කර තිබේදැයි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් හෝ ඔහුගේ බලයලත් වෙනත් වගකිව යුතු නිලධාරියෙකු විසින් හෝ පෞද්ගලිවම සොයා | දෙපාර්තමේන්තුවේ සේවය කරන ලද නිලධාරීන්, කිසිදු අවස්ථාවක කැලි ගණනට ගෙවීම් කරනු ලබන වැඩ සඳහා අතිකාල ලබාදෙනු නොලබන අතර අතිකාල ලබා ගැනීමේදී එම අතිකාල වෙනුවෙන් සාධාරණ ලෙස වැඩ නිම කරනු ලැබේ. එලෙස දිවා/රාත්‍රී අතිකාල සේවයේ යෙදවීමේ දී එම නිලධාරීන්ට නිශ්චිත වූ වැඩක් ලබාදෙන අතර එය අනිවාර්යයෙන් නිමකර පසු | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කිරීමට ආයතන ප්‍රධනියා ප්‍රබලව ක්‍රියා කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | බලා සැහීමකට පත් විය යුතුය. මේ කාර්යය සඳහා නියම වැඩ ප්‍රමාණයක් ඉටු කෙරෙන බවටත් නිශ්ක්‍රියව සිටින කාලයට අතිකාල දීමනා නොගෙවනු ලබන බවටත් වග බලා ගැනීම පිණිස නිසි පරීක්ෂණ හා වාර්තා තබා ගැනීමේ ක්‍රමයක් සකස් කර ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ යුතුකම වුවද මුද්‍රණ දෙපාර්තමේන්තුව අතිකාල ගෙවනුයේ කාලගණන අංශය ලබා දෙන අතිකාල පැය පදනම් කර ගෙන බවටද, එය අදාල අංශ වල වැඩ මුලික හෝ සහකාර මුද්‍රණාලයාධිපති විසින් අධික්ෂණයක් හෝ එම කාලය තුල නිශ්චිතවම කාර්යයන් ඉටු කරනවාද/නැද්ද යන්න සොයා බැලීමක් හෝ වාර්තා කිරීමක් කර නොතිබුණි . | දින නිම කෙරූ අදාල වැඩ පිළිබඳව වාර්තාවක් ලබාදීමට කටයුතු කරනු ලබන බව ද කාරුණිකව දන්වා සිටිමි. | |
| (ඕ) | භාණ්ඩාගාර ලේකම්ගේ 2023 පෙබරවාරි 02 දිනැති අයවැය චක්‍රලේඛ අංක 02/2023 හි කොන්දේසි වලට අනුකූල නොවන පරිදි 2023 වර්ෂයේ මුද්‍රණ කාර්යයන් ඉටුකිරිම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවලින් අයවිය යුතු ආදායම රු.210,048,234ක් විය. | පිළිතුරු ලබා දී නොමැත | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |
| (ක) | භාණ්ඩාගාර ලේකම්ගේ 2023 පෙබරවාරි 02 දිනැති අයවැය චක්‍රලේඛ අංක 02/2023 හි 03 ඡේදය | මැතිවරණ කොමිෂන් සභාව විසින් අප වෙත පවරා දුන් රු.මිලියන 300 ක ප්‍රතිපාදන වලින් රු.මිලියන 260 ක් | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය. |

| | |
|---|---|
| ප්‍රකාරව ´´කල් දැමිය නොහැකි අත්‍යවශ්‍ය මහජන සේවා සම්බන්ධව සහ එදිනෙදා අත්‍යවශ්‍ය රාජකාරී කටයුතු සඳහා රාජ්‍ය සහ පෞද්ගලික ආයතන ණය පදනම මත සේවා ලබාගැනිම සම්බන්ධයෙන් මෙම චක්‍රලේඛය මඟින් බාධාවක් ඇතිවිය නොවිය යුතු´´ බවට සඳහන් වුවද, මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කටයුතු සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත පැවරූ රුපියල් මිලියන 260 ක ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මැතිවරණ කටයුතු සඳහා නියමිත සම්පූර්ණ මුද්‍රණ කටයුතු සිදුකර නොතිබුණි. | නැවත පවරා ගෙන තිබුණි. 2023 පළාත් පාලන මැතිවරණ කටයුතුවලට අදාලව භාරදෙන ලද සියළු ඇණවුම් සඳහා වැඩ පත්‍රිකා නිකුත් කොට අදාල අංශ වෙත යොමු කොට අවසන් වී ඇති අතර එයින්ද 2023 මාර්තු 16 වන විට සැලකිය යුතු වැඩ පත්‍රිකා ප්‍රමාණයක වැඩ අවසන් කර ඇත. ඒ වන විටත් මැතිවරණ කොමිෂන් සභාව විසින් මැතිවරණ කටයුතුවලට අදාලව අප වෙත ගෙවා ඇති මුදල මිලියන 40 ක් පමණක් වුවද අප දෙපාර්තමේන්තුව මඟින් මැතිවරණ කටයුතු වෙනුවෙන් වන මුද්‍රණ කටයුතු සිදු කිරීම නතර නොකළ බව කාරුණිකව දන්වා සිටිමි. |

### 3.3 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ ආපනශාලාවේ විදුලි සෝපානය අළුත්වැඩියාවට පෙර විශේෂඥයකුගේ උපදෙස් හා නිසි අයුරින් කරුණු සොයාබැලීමක් සිදු නොකිරීමත්, නිසි ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය නොකිරීමත් නිසා රු.98,150 ක වියදමකින් මිලට ගෙන ඇති INVENTOR MOTHER BOARD අමතර කොටස සවි නොකර දෙපාර්තමේන්තුවේ ගබඩාවේ නිෂ්කාර්යයව | මෙම විදුලි සෝපානය භෝජනාගාරයේ විදුලි සෝපානය බැවින් එය ඉතා කඩිනමින් සකස් කර දෙන ලෙස භෝජනාගාරයේ කළමණාකාරිත්වය විසින් දන්වන ලදි. එහෙත් විදුලිබල මණ්ඩලය විසින් අළුත්වැඩියාව සඳහා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුවේ අගය ඉතා ඉහල අගයක් වූ බැවින් ප්‍රසම්පාදන මණ්ඩලය විසින් ලබාදුන් උපදෙස් පරිදි දෙපාර්තමේන්තුවේ විදුලි අංශයට මෙය පරීක්ෂා කර බලා දෝෂය නිවැරදි කිරීමට හැකියාවක් තිබේදැයි විමසන ලදි. ඒ අනුව, විදුලි අංශයේ නිලධාරීන් ද මෙය පරීක්ෂා කිරීමේ දී ඉහත සඳහන් | ප්‍රසම්පාදන කටයුතු මනාව සැලසුම් කර කාලීනව සිදු කිරීමට හැකි පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම කඩිනමින් විධිමත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| තබා තිබුණි. | Control Board (Inverter Motherboard) කොටස අක්‍රීය වී ඇති බව නිරීක්ෂණය කර ඇත. විදුලිබල මණ්ඩලයේ නිර්දේශය මත එම කොටස ඒ වන විටත් මිල දී ගැනීමේ කටයුතු ආරම්භ කර තිබූ අතර එය ලැබෙන තෙක් විදුලි අංශය විසින් මෙම අයිතමය අළුත්වැඩියා කිරීමට උත්සාහ කර එය නිවැරදිව සිදු කර ඇති අතරම එය මේ වන විට ද නිසි පරිදි ක්‍රියාකාරී වේ. එහිදී Inverter Motherboard මිල දී ගැනීම සඳහා රු 98,150 ක මුදලක් පමණක් වූ අතර එයද භාවිතා නොකර අවශ්‍ය අවස්ථාවක දී භාවිතා කිරීම සඳහා Inverter Motherboard කොටස තොග අයිතමයක් ලෙස පවත්වා ගෙන යෑමට කටයුතු කර ඇත. | |

**3.4 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනිමේ පනතේ 460 පරිච්ඡේදයේ 44 වගන්තිය යටතේ 2003 ජනවාරි 31 දින කතරගම ප්‍රාදේශිය ලේකම් මගින් මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත 2003 ජනවාරි 31 දින පවරා තිබූ විශාලත්වය හෙක්ටයාර් 0.105 ක් වූ ඉඩම රජයේ ආයතනයක් නොවන රජයේ මුද්‍රණාලිය සමුපකාර සකසුරුවම් භා ණය දෙන සමිතිය යන ආයතනයේ පරිහරණයට ලබා දී තිබුණි. | මෙම දෙපාර්තමේන්තුවට අයත් කතරගම ප්‍රදේශයේ පවතින ඉඩමේ නිවාඩු නිකේතනය ඉදිකිරීමේ කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වා සිටිමි. | විධිමත් ක්‍රමවේදයකින් තොරව රජය සතු ඉඩම් බාහිර පාර්ශවයන්ට පරිහරනයට ලබා නොදිය යුතුය. |